රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකය: 93
ආයතන මාලා අංකය: 70

මගේ අංකය: 543ජ 447 ඩී.
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.
1974 නොවැම්බර් මස 08 දින.

සියලුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත.

<u>පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම.</u>

1974.04.29 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 83 කෙරේ අවධානය යොමු කළ මැනවි.

2. ඇතැම් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විශේෂයෙන් පිට පළාත්වල සේවය කරන්නවුන් පිළිබඳ වූ පරීක්ෂණ නිලධාරී ලැයිස්තු මේ වන තෙක් සපයා නොමැත. දැනට යවා නොමැති නම්, රාජ්‍ය සේවා විනය මණ්ඩල ලේකම් වෙත මෙම ලැයිස්තු සැපයීමට කඩිනම් පියවර ගැනීම මැනවි.

3. පරීක්ෂණ නිලධාරීන් වශයෙන් පත් කරනලද රාජ්‍ය නිලධාරීන් හදිසි නොවූත්, බලවත් නොවූත් නොයෙක් හේතු සාධක දක්වමින් මෙම පත්වීම භාර ගැනීමට නොහැකි බව පළකල අවස්ථා බොහෝය. සෑම වසරකටම එක් වතාවක්වත් මෙසේ පත් කරනලද සෑම නිලධාරියකු විසින්ම පරීක්ෂණයක් පැවැත්විය යුතු බව සැළකිය යුතුව ඇත. මේ සම්බන්ධව ආයතන සංග්‍රහයේ 11 වැනි කාණ්ඩය XLVIII පරිච්ඡේදයේ 12:6 වැනි වගන්තිය වෙත ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

Siriwardhana

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

ඩී/12-